gender & mine action

# ප්‍රකාශනයේ සංක්ෂිප්තය

## "ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බිම්බෝම්බ - සංකල්පයේ සිට පරිහරණය දක්වා"

බිම්බෝම්බ හේතු කොට ගෙන කාන්තාවන් හා පිරිමින් විපතට පත්වන ආකාරය වෙනස්වීම නිසාම ඔවුන්ට උපකාර කිරීමේදි ද වෙනස් වූ ආකාරයන් භාවිතා කිරීමට සිදුවේ. මේ නිසාම බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාදාමයේ අන්තර්ගත කොටසක් හැටියට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තිබිය යුතු අතර එය නොසලකා හැරිය නොහැක. මෙම වැදගත් කරුණ තවදුරටත් තහවුරු කරනු වස් බිම්බෝම්බකරණය සඳහා වූ Swiss ව්‍යාපාරය බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාදාමයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලප්‍රවාහකගත කිරීමේ උත්සාහයන් හදාරන ලද "ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ බිම්බෝම්බ ඉවත් කිරීම- සංකල්පයේ සිට පරිහරණය දක්වා" යන වාර්තාව එළි දක්වා ඇත. මෙය සකස් කර ඇත්තේ බිම්බෝම්බ ඉවත් කරන ක්‍රියාවලියේ කාර්ය මණ්ඩලය, තීරණ ගන්නා අය ඇතුළු වැඩ සටහන් නිෂ්පාදකයින්ට ආධාර දෙන කණ්ඩායම් සහ ක්‍රියාත්මක කරන ආයතන සහ සහාය දක්වන කණ්ඩායම් වලට උදාහරණයක් වශයෙන් තෘණ මූල මට්ටමේ කාන්තා සංවිධාන.

මෙම වාර්තාවෙන් රටවල් **05** ක කරන ලද ක්ෂේත්‍ර පර්යේෂණ මත පදනම් වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බිම්බෝම්බ ඉවත් කිරීම පිළිබඳ තේරුම් ගෙන ඇති, හඳුනාගෙන හෝ ප්‍රතික්ෂේප කොට ක්‍රියාත්මක කර හා ප්‍රතිඵල ලබා ගෙන ඇති ගැඹුරු විස්තර හුවා දක්වයි. මෙම වාර්තාවෙන් බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියේ මූලික පදනම් හතරේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සාකච්ඡා කරයි. (බිම් බෝම්බ ඉවත් කිරීම/ සංගණනය බිම්බෝම්බ අවධානම පිළිබඳ අධ්‍යයනය (MRE), විපතටපත් වූවන්ට උපකාර සහ උද්දේශනය) සහ ක්ෂේත්‍රය තුලින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය ක්‍රියාකාරකම් සහ යහපුරුදු ඉදිරිපත් කරයි. මෙම වාර්තාවේ ප්‍රධානම අංගය වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සමානාත්මතාවය පමණක් නොව ගුණාත්මකභාවයත් යන්නයි. සියළු ජනතාවගේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනීමෙන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය දැක්මක් අන්තර්ගත කිරීමෙන් බිම්බෝම්බ ඉවත් කිරීමේ ප්‍රතිඵල සහ ඵල වඩාත් යහපත් වේ.

### ***<u>බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලප්‍රවාහකගත කිරීම සම්බන්ධව ඇති මිත්‍යා විශ්වාස.</u>***

මිත්‍යා විශ්වාස 01: " බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය මූලප්‍රවාහක ගත කිරීමෙන් කාන්තාවන්ගේ පමණක් සුභසාධනය ලැබෙන අතර කාන්තාවන් පමණක් ඉලක්කකොට ගනී"

බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය දැක්මක් අන්තර්ගත කිරීම තුළින් කාන්තාවන්ට, ගැහැණු ළමුන්ට, පිරිමින්ට සහ පිරිමි ළමුන්ට යන සමාජයේ සියළුම සමාජිකයින්ට ප්‍රතිලාභ ලැබෙන අතරම ඔවුන් සියළු දෙනාම ඉලක්ක කරගනු ලැබේ. පිරිමින් හා ගැහැණුන් යන දෙකොට්ඨාශයෙන්ම සැදුම් ලත් සංගණන කණ්ඩායම් උපයෝගි කර ගෙන කාන්තාවන් හා පිරිමින් යන දෙකොට්ඨාශයෙන්ම බිම්බෝම්බ වලින් විපතට පත් ප්‍රජාවගේ විස්තර එකතු කරන සංගමයන් මගින් එක් ප්‍රබල උදාහරණයක් ඉදිරිපත් කර ඇත. කාන්තාවන් හා පිරිමින් එකිනෙකාට වෙනස් වූ දැනුම උපයෝගි

Campagne suisse contre les mines antipersonnel
3bis, chemin des Pontets, CH-1212 Grand-Lancy, Geneva, Switzerland.
Tel. +41 22 879 10 52 - Fax. +41 22 879 10 51
info@scbl-gender.ch www.scbl-gender.ch www.stopmines.ch

කරගෙන බිම්බෝම්බ ගහන එක් එක් ප්‍රදේශ හඳුනාගනු ලබයි. මෙම උදාහරණයෙන් පෙන්නුම් කරන්නේ එක් කොටසක් පමණක් මෙම සංගණනයට එක් කොට ගත්තා නම් වටිනා තොරතුරු රාශියක් දැන ගන්නට හැකි නොවන බවයි.

**මිත්‍යා විශ්වාස 02. "ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංකීර්ණ වන අතර එය ක්‍රියාත්මක කරවීම අධික වියදම් සහිත ක්‍රියාවලියකි".**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංකීර්ණ යැයි කියා සිටිය ද බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය සංස්කෘතිය, පළාත හා මූලික පදනම නොතකා ලොව පුරා භාවිතා කළ හැක. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මූලප්‍රවාහකගත කිරීම අවම වියදමකින් ඉතා සුළු මුදලින් ක්‍රියාත්මක කළ හැක. ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය අවබෝධයකින් තැඹුරුවක් ඇති බවට උදාහරණ වන්නේ පිරිමින් කාන්තාවන් පිරිමි ළමුන් හා ගැහැණු ළමුන් මෙම ක්‍රියාදාමය තුළ සිටින බව හඳුනාගත හැකි පත්‍රිකා බිම්බෝම්බ පිළිබඳ අධ්‍යයනයට ඇතුළත් කිරීම තුළින්ය. මෙම ක්‍රියාදාමය ඉතා අඩු වියදමකින් කළහැකි අතර මෙමගින් සමාජයේ සියළුම දෙනාම කිසිම ලිංග භේදයකින් තොරව නොකොට සහභාගි කරගත හැකිය.

**මිත්‍යා විශ්වාස 03. ,බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මූලප්‍රවාහකගත කිරීමට සංස්කෘතික සහ සම්ප්‍රදායන් මූලිකවම බාධාවක් වන බව.**

තෝරාගත් රටක ඊටම ආවේණික වූ තත්වය ගැන සඳහන් කොට ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය ඉලක්කයන් අන්තර්ගත නොකිරීමට සාමාන්‍යයෙන් සංස්කෘතික හා ආගම සම්බන්ධ තර්ක ගෙනහැර පායි. නමුත් ප්‍රායෝගික පර්යේෂණ කරන ස්ථාන වලදි ප්‍රතිඵල වූයේ හාත්පසින්ම ඒ මතයට විරුද්ධ දෙයකි. ඇත්ත වශයෙන්ම නොදැනුවත්කම හා උවමනාවක් නැති බව නියම සාධකය බවට පත්ව ඇත. ලොවපුරා සංවිධාන ඉතා ,කළ නොහැකි, යැයි සඳහන් පරිසර තුළ කාන්තා බිම්බෝම්බ ඉවත් කරන්නියන් සම්බන්ධ කරගෙන ඇත. සාර්ථක වැඩපිළිවෙළවල් දියත්කර ඇත. උදාහරණ වශයෙන් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාට ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය කාචයකින් බලා මතිමතාන්තර අභියෝග වලට ලක් කරමින් ක්‍රියා කිරීමේදි මේ ආයතන දැන ගත්තේ සංස්කෘතිමය හා සම්පදායන් වලින් තියෙනවා යැයි කී බාධක ඇත්ත වශයෙන්ම නැති බවය.

**මිත්‍යා විශ්වාස 04. ,ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය මූලප්‍රවාහකගත කිරීම යනු කාන්තාවන්ට රැකියාවල් පමණයි,**

සංවිධාන බොහෝමයක් කාන්තාවන් රැකියාවට බඳවා ගැනීමෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය දැක්මක් අන්තර්ගත කළායැයි විශ්වාස කරයි. කාන්තාවන් රැකියාවට බඳවා ගැනීම, උදාහරණ වශයෙන් බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියේ කාන්තා සහභාගීත්වය තහවුරු කරන ඉතා හොඳ ක්‍රමයක් බව නොරහසකි. මෙසේ කර ඇති රටවල් අතරින් කිපයක නම් සඳහන් කරන්නේ නම් ලාඕසය, කාම්බෝජය, හා ලෙබනනය යන රටවල් හඳුන්වා දිය හැකිය. මේ රටවල්වල කාන්තාවෝ අන් කාන්තාවන්ට ආදර්ශමත් කටයුතු කරති. නමුත් සුලභ වශයෙන් දක්නට ලැබෙන සාම්ප්‍රදායිකව පිරිමින් කරන ලද බිම්බෝම්බ ඉවත් කිරීම වෙනුවට කාන්තාවන් යොදා ඇත්තේ පරිපාලනය අධ්‍යාපනය සහ පුනරුත්ථාපනය වැනි ඒකායන රාජකාරි වලයි. කාන්තාවන් රැකියාවට බඳවා ගැනීම ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය මූලප්‍රවාහකගත කිරීමේ එක් අංගයක් පමණි. නමුත් එයම පමණක් සමානාත්මතාවය හා ගුණාත්මක බව තහවුරු කිරීමට ප්‍රමාණවත් නැත..

**ඔබ දැනගෙන සිටියේද ......**

- 2006 වසරේදි යුද්ධ හේතු කොට ගෙන බිම්බෝම්බ සහ අතිකුත් බෝම්බ හේතු කොට ගෙන තුවාලකරුවන් 5751 සිටී බව සහ එයින් 89% ක් ම පිරිමින් බව ?
- උපකාර කිරීමේදි ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය අසමානතා නිසා කාන්තාවන්ට ක්ෂණික ප්‍රතිකර්ම අඩුවීම හේතු කොට ගෙන කාන්තාවන් (43%) ක් මරණයට පත්වූ බව. පිරිමින් (29%)සාපේක්ෂව ?
- සමහර අධ්‍යයන පෙන්වා දෙන්නේ බිම්බෝම්බ වලින් විපතට පත් වූවන්ගේ බිරින්දෑවරු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට වැඩිපුර භාජනය වන බවයි ?
- කාන්තාවන්ට හා පිරිමින්ට බිම්බෝම්බ ඉවත් කරන ලද ඉඩම්වල අසමානතා ඇති බව ?
- තුවාල වූවන්ගෙන් බහුතරය පිරිමින් වූවාට බිම්බෝම්බ පිලිබඳව අධ්‍යයනය නිතරම පාහේ කාන්තාවන් ඉලක්ක කර ගන්නා බව ?
- බිම්බෝම්බ වලින් ,විපතට පත් වූවන් යන්නෙහි නිත්‍යානුකූල විශ්ලේෂණය බිම්බෝම්බයට ගොදුරු වූවා පමණක් නොව (බහුතරය පිරිමින් වන) ඔහුව බලා ගන්නා සහ ඔහුගෙන් යැපෙන ඔහු සමග ජීවත්වන අයද (ප්‍රධාන වශයෙන් කාන්තාවන්) ඇතුලත් වන බව ?

